# මයිකල් ඇන්ජිලෝ

ඉතාලි ජාතික මූර්ති ශිල්පියෙකි. චිත්‍ර ශිල්පයෙහි ද දස්කම් පෑවෙකි. 1475 මාර්තු මස 06 වනදා ඉතාලියේ කැප්රීසියේ දී උපන් ඔහු උපතින් ලත් නාමය වූයේ මයිකල් ඇන්ජිලෝ දි ලොබොවිකො බුවනොරොත්ති සයිමොනි යන්නයි. පියා ලොබොවිකො දි ලියොනාදෝ බුවෝනොරොත්ති සයිමොනි නම් නගරාධිපති වරයා ය. ඔහුගේ පියා මහේස්ත්‍රාත්වරයෙක් ලෙස ද ඇතැම් තැනෙක සඳහන් වෙයි. ෆැන්සෙස්කා ද නෙරි නම් කැප්රීසියේ කාන්තාව ඔහුගේ මව විය. කැප්රීසිය යනු ෆ්ලෝරන්සයේ සිට කිලෝමීටර් 65 ක් පමණ දුරින් පිහිටි ටස්කන් ප්‍රදේශයට අයත් කුඩා නරගයකි.

වර්ෂ 1485 වැන්නේ දී පමණ මයිකල් ඇන්ජිලෝගේ ජීවිතයේ විශේෂ වෙනසක් සිදුවිය. ඒ ඔහුගේ පියාගේ දෙවන විවාහයෙන් පසුව සිය සොයුරන් සිව්දෙනා ද සමඟ සන්තාක්‍රොස්හි කුඩා අඳුරු නිවහනක් වෙත සිය පදිංචිය මාරු කිරිමට සිදුවීමයි. ඔවුන් සමඟ ඔවුන්ගේ සුළු මව වශයෙන් සැලකෙන කාන්තාවක් ද සිටි වග සඳහන් වෙයි.

ෆැන්සෙස්කෝ ද උරුබිනෝගේ පාසලට ඇන්ජිලෝ ඇතුළත් වන්නේ ද ඔහු ෆ්‍රැන්සිස්කෝ ග්‍රැනසි නම් තරුණ සිත්තරාගේ ඇසුරට පත්වන්නේ ද මෙහිදී ය. ග්‍රැනසි

යනු එකල එම ප්‍රදේශයේ ප්‍රචලිත චිත්‍ර කලා ශිල්පායතනයක් වූ ගෙරාලන්දේ සොහොයුරන්ගේ ශිල්පායතනයේ සේවය කළ අයෙකි.

1488 අප්‍රේල් මාසයේ සිට ග්‍රැන්සියෙට් ද උපකාරයෙන් එම ශිල්පායතනයේ අධ්‍යයන කටයුතුවලට සම්බන්ධ වන ඇන්ජිලෝ එහිදී ගිටෝ, මසාඩෙ ආදී ශිල්පීන්ගේ කෘති පිටපත්කරණයෙහි යෙදුණේය. එහෙත් ඇන්ජිලෝ මූර්ති ශිල්පය පිළිබඳ උගනින්නට පෙළඹෙන්නේ බර්ටෙල්දෝ නමැති මූර්ති ශිල්පියාගේ ශිල්පායතනයේ දී ය.

පැරණි ශිල්පීන්ගේ මූර්ති නිර්මාණ මැටි භාවිතයෙන් ප්‍රතිනිර්මාණය කරමින් සිය මූර්ති කලා දිවිය ඇරඹූ ඇන්ජිලෝ ලොරන්සෝ ද මෙදිසි නම් ජන නායකයාගේ ඇගයීමට ද සැලකිල්ලට ද ලක්වීම ඔහුගේ ජීවිතයේ නවමු පිටුවක් පෙරළීමට සමත් විය. 1490-91 කාලයේ සිදුවූ මෙම පෙරළියත් සමඟ ඇන්ජිලෝට නව නවාතැනක් ද මානව හිතවාදී කාලකරුවන් රැසක් ඇසුරු කිරීමේ අවස්ථාව ද හිමි විය.

මේ අනුව ලොරොන්සෝද මෙදිසිගේ මාළිගයේ අමුත්තෙකු වශයෙන් වාසය කිරීමේ අවස්ථාව ඇන්ජිලෝට ලැබුණි. එහිදී පොලිසියානෝ, ක්‍රිස්ටෝපොරෝලන්දිනෝ, මාර්සිලියෝ ෆිසිනෝ වැනි කලාකරුවන් ඇසුරු කිරීමේ අවස්ථාව ඔහුට හිමි විය.

ෆිසිනෝ විශ්වාස කළේ ප්ලේටෝගේ දර්ශනයයි. රෆායෙල්ට ද ෆිසිනෝගේ ඇසුර නිසා ප්ලේටෝගේ දර්ශනයේ ආභාසය ලැබුණි. ප්ලේටෝගේ දර්ශනයට අමරතව ක්‍රිස්තියානි ආගමෙහි ආභාසය ද ලැබූ ඇන්ජිලෝ 'පියගැටපෙළෙහි හිඳුනා කුමරි මරියාව' නමැති මූර්තියෙන් ඒ ආභාසයන් ද පිළිබිඹු කළේය.

ප්‍රංශ තර්ජන නිසා ෆ්ලෝරන්සස් තත්ත්වය තරමක් අයහපත් අතට හැරෙමින් තිබුණේ මීට ආසන්න කාලයක සිට ය. ඇන්ජිලෝගේ පියා ඒ වන විට අයබදු නිලදරුවෙකු ලෙස රැකියාවේ වෙනසක් ඇති කරගෙන සිටියේ ය. ලොරෙන්යෝද මෙදිසිගේ ආභාසයෙන් පියරෝ මෙදිසි එම තනතුරට පත්ව සිටියේය. ඉතාලිය තරමක් වෙනස් වෙමින් පැවතුනි.

පියරෝ මෙදිසිගේ මන්දිරයේ විවිධ මූර්ති නිර්මාණ කිරීමට ආරාධනා ලැබූ ඇන්ජිලෝ එම කාලයේම ෆ්ලෝරන්සයේ අධ්‍යාත්මික නායක සැමෝනරෝලා ගේ දේශන වලට ද සවන් දීමට කාලය වෙන් කළේය. මේ දේශන ඔහු තුළ සිටි මහා කලාකරුවන්ගේ මානව හිතවාදි ගුණ වැඩි වර්ධනය කරන්නට ඇතැයි සිතිය හැක.

කිරිගරුඬ, ලී වැනි දේ යොදාගෙන නව නිර්මාණ බිහිකළ ඇන්ජිලෝ මේ යුගයේ පටන් ඒ සඳහා බහුලව යොදා ගත්තේ අධ්‍යාත්මික, ආගමික තේමාවන්ය. ඊට අනුව හර්කියුලිස්ගේ මූර්තියටත් කිරිගරුඬ යොදාගෙන නිර්මාණය කළ ඔහු දරුමය කුරුසියක් ද නිර්මාණය කළේය. එහෙත් උදාවී තිබූ වාතාවරණය නිසා තවදුරටත් ෆ්ලෝරන්සයේ දිවිය අස්ථිර වූයෙන් බොලෙග්නාවට පලා ගිය ඇන්ජිලෝ යලි වැනීසියට පලා ගියේය. එහෙත් ආර්ථික දුෂ්කරතා මතු වීම නිසා යළි බොලෙග්නාවටම පැමිණි ඇන්ජිලෝ එහිදි ජැක්නෝ දෙලාක්වේසියා නම් අග්‍ර මූර්ති ශිල්පියාගේ කෘති නරඹා ප්‍රබෝධයට පත්විය.

''ඉටිපන්දමක් රැගෙන හිඳුනා සුර දූතයා'' නම් කෘතිය ඇන්ජිලෝ අතින් නිර්මාණය වන්නේ මේ යුගයේය. එම මූර්තියේම පිටපත් 3 ක් ඔහු ශාන්ත ඩොමිනිකෝ දේවස්ථානයට සැපයූ වග සඳහන් වෙයි. මේ කාලයේ පටන් ඇන්ජිලෝට විවිධ ඇනවුම් ගලා එන්නට විය. ඔහුගේ ආර්ථිකය ද ශක්තිමත් විය. 1495 අග දී යළිත් ෆ්ලෝරන්සයට පැමිණි හෙතෙම ලොරෙන්සෝ ද පියර්ෆරැන්සිස්කෝ ද මෙදිසි වෙනුවෙන් ශාන්ත ජොන්ගේ යෞවන ස්වරූප මූර්තිමත් කළ රමණීය මූර්තියක් නිර්මාණය කිරීමත් සමඟ ෆ්ලෝරන්සයේ නව යුගය ඇරඹීය. එතැන් පටන්,

සැතපෙන අනංගයා (1496)

ග්‍රීක් ඉරු දෙවියා (1496 - 1501)

බැකස්

කරුණාව (1499)

දවිත් (ඩේවිඩ්) (1501)

සියානා දෙව්මැදුරේ අල්තාර මූර්ති කිහිපය

ෆ්ලෝරන්ස්හි ඩුම්මෝ සඳහා ධර්ම දූතයන්ගේ මූර්ති

කුමරි මරියාවයි ජේසු බිළිදායි (සිත්තම)

දෙවන ජුලියස් කාප් තුමාගේ ප්‍රතිමාව

සිස්ටයින් දෙව්මැදුරේ වියන්තල සිතුවම් (1508 - 12)

සිරහාරයට ගත්තවුන්

ඇපලෝ

ශාන්ත පෝල්ගේ පරිවර්තනය (සිත්තම) ආදී නිර්මාණ රැසක් ලොවට දායාද කළේය.

මෙ නිර්මාණ කළ අතර කාලයේ ඔහුගේ ජීවිතයේ ද විවිධ වෙනස්වීම් ආදිය සිදුවිය. විවිධ අත්දැකීම් වලට මුහුණ දුන්නේය. සියාන දෙව්මැදුරේ අල්තාර මුර්ති 15 ක් සඳහා ඇනවුම් ලැබුණද ඔහු නිම කළේ ඉන් කිහිපයක් පමණි. දෙවන ජුලියස් පාප්තුමාගෙන් ඔහු ලද ඇනවුම භාර නොගත්තේ පාප්තුමා තමා නොසලකා හැරියේ යැයි ඇන්ජිලෝට සිතුණු බැවිනි.

පසුව කුසිතානහි සටන් නිරූපණ ආර්දශ සටහන් ද පාප්තුමාගේ සොහොනේ සැලසුම් කටයුතු ද කළ නමුත් ඒවා නිම කළ වගක් නොපෙනෙන් සිස්ටයින් දෙව්මැදුරේ කටයුතු ද ඔහු නිම කළේ අවස්ථා දෙකකදිය. මුල් අවස්ථාවේදී හෙතෙම යම් සිත්තැවුලක් නිසාවෙන් එම කටයුතු නතර කොට දැමීය. එහෙත් යළිත් පාප් වහන්සේගේ ඉල්ලිමෙන් හා මැදහත්වීමෙන් යළි සිතුවම් ඇඳීම ඇරඹීය. ජුලියස් පාප් වහන්සේ ගේ ස්වර්ගස්ථවීමෙන් පසු උන්වහන්සේගේ උරුමක්කරුවන් සමඟ ගිවිසුම් හතරක් පමණ ඇතිකර ගනිමින් සොහොන් ගෙය නිමවීමට උත්සාහ කළ ද ඒ සැම විටකම ඇන්ජිලෝ විසින් කලාකරුවෙකුට සාධාරණ වු හේතු සාධක මත කටයුතු පමා කළේය.

ඇන්ජිලෝ ගේ ලාසරස් නම් නිර්මාණය ඇතුළු නිර්මාණ කිහිපයක් සඳහා අනුග්‍රහ දැක්වු සෙබස්තියන් නමැත්තා මුණගැසෙන්නේ ද මේ කාලවකවානුවේදිමය.

1510 - 15 කාලයේදී ෆ්ලෝරන්සය සැරසීමේ කටයුතු සඳහා දසවන ලියෝ පාප්තුමාගේ ආරාධනය ලැබු කලාකරුවන් අතර මයිකල් ඇන්ජිලෝ ද සිටියේය. ශාන්ත ලොරෙන්සෝ මැදුර අලංකාර කිරිම උදෙසා පාප්තුමන් සමඟ සාකච්ඡා කළ ද ජලුයිස් පාප් වහන්සේගේ සොහොන්ගෙයි කටයුතු නිමකරනු සඳහා වෙනත් කටයුතු පමා කිරීමට

ඔහු සිදුවිය. එහෙත් රෝමයේ පිහිටි ඔහුගේ නිවසේ තිබූ ඇතැම් සැලසුම් සටහන් ආදිය ගිනිගෙන විනාශ වූයෙන් ඇල්ජිලෝ නිවස අත්හැර ගොස් ෆ්ලෝරන්සයේ තමා වෙනුවෙන් නිවසක් හා ශිල්පායතනයක් තැනීමට කටයුතු කළේය.

ඒ 1518 දී පමණය. මේ කාලයේදී ම ඔහු ජේසුස් වහන්සේගේ ප්‍රතිමූර්තියක් නිමවීමට කටයුතු කළ ද ඒ සඳහා යොදාගත්තේ කිරිගරුඬ ය. ඉරිතලා ගොස් තිබුණෙන් ඒ කටයුතු ද අතරමඟ අත්හළේය. ජුලියස් පාප් වහන්සේගේ සොහොන් ගෙයි කටයුතු කිරීමන් සිටි කාලයේ රජයේ හමුදා විසින් රෝමය අත්පත් කරගත් අතර ෆ්ලෝරන්ස්ගේ ආරක්ෂාව සඳහා ඇන්ජිලෝට යුධ ඉන්ජිනේරුවෙකු සේ කටයුතු කිරිමට සිදුවිය. මයිකල් ඇන්ජිලෝ ද්‍රෝහියෙකු සේ සලකා දේපල රාජසන්තක කිරිමට ද රජයේ හමුදා උත්සාහ කළ අතර ඇන්ජිලෝ ආරක්‍ෂාව පතා සැඟවී සිටියේය. එහෙත් පාප්තුමාගේ සමාව යටතේ යළි එහි කටයුතු අරඹන ඇන්ජිලෝ පාප්වහන්සේ සමඟ ගිවිසගත් පරිදි මෙදිසි මැදුරේ කටයුතු තවදුරටත් සිදු කළේය. ඒ අතර කාලයේ ඇන්ජිලෝගේ පියා ද මිය ගියේය.

ජීවිත කාලය පුරා ඇන්ජිලෝ වඩාත් සමීපව අසුරු කළ මිත්‍රයා වූයේ කැවලියරි නමැත්තාය. ඔවුන්ගේ මිත්‍රත්වය ඇරඹෙන්නේ ඉහතකී සිදුවීම් පෙළට පසු ශීත ඍතුව ගත කිරීමට පිණිස ඇන්ජිලෝ රෝමයට ගිය අවස්ථාවේදීය. ඇන්ජිලෝ විසින් ලියූ කවි ද සිත්තම් ද ඔහු සිය මිත්‍රයාට තිළිණ කළේය. අවසාන විනිශ්චය නමැති සුවිසල් සිත්තම සඳහා ඇන්ජිලෝ පාප් වහන්සේගේ ඇරයුම ලබන්නේ මේ කාලයේදීය ෆ්ලෝරන්සයි පාලකයින් පිළිබඳව වූ පිළිකුල නිසා මෙතැන් පටන් කිසිදින යළි ෆ්ලෝරන්සයට නො යමියි සිතා ගත් ඇන්ජිලෝ තමා ලැබූ ඇනවුම් නිම කරමින් රෝමයේම විසුවේය. ෆ්ලෝරන්සගේ පාලක මෙදිසිවරු විටින් විට ඇන්ජිලෝ යළි ගෙන්වා ගැනීමට උත්සාහ කළ ද ඇන්ජිලෝ ඊට එකඟ නොවීය.

අවසාන විනිශ්චය සිත්තම නිමකිරිමට ප්‍රථම VII වන ක්ලෙමන්ට් පාප් තුමා ස්වර්ගස්ථ වුවද ඊට පසු එම ධුරයට පත් ඇලෙක්සැන්ඩ්රෝ ෆානිස් පාප් තුමා ඇන්ජිලෝට එම කටයුතු යළි ඇරඹීමට ඇරයුම් කළේය. 1541 දි එම සිත්තමේ කටයුතු නිමා කළේය. ශාන්ත පෝල් ගේ පරිවර්තනය නම් කෘතිය ඇන්ජිලෝ විසින් නිම කළේ VII වන පෝල් පාප් තුමාගේ ඇරයුම අනුවය. මේ කාලෙය්දිම පියට්රෝඅරනිනෝ විසින් ඇන්ජිලෝයේ අවසාන විනිශ්චය නම් කෘතිය පිළිබඳ විවේචනාත්මකව ඉදිරිපත් කළ ලිපිය ඇන්ජිලෝ මත තදබල පීඩනයක් ඇති නොකළ බව පෙනීගියත් එය ඔහුට

තරමක ප්‍රතිරෝධයක් විය. අරතිනෝ විසින් ඇන්ජිලෝගේ අවසාන විනිශ්චය සිත්තකමේ නග්න රූප අශෝභන යැයි විවෘත සංදේශයක් මගින් එසේ විවේචනය කළේය. එහෙත් ඇන්ජිලෝ සිය කෘතියේ කිසිදු වෙනසක් නොකළේය.

මින් අනතුරුව ඇන්ජිලෝ මුල පුරන්නේ කිතුනු ඉතිහාසයේ අතිපූජනීය කලා නිමැවුම වන පියෙටා නම් කෘතිය නිර්මාණය කිරීමටයි. මේ නිර්මාණය පිළිබඳව විවිධ මතවාද පවති. ඇතැමෙක්ට අනුව අද දක්නට ඇති පියෙටා මූර්තිය ඇන්ජිලෝගේ පියෙටා මූර්තිය නොවේ. එහෙත් පියෙටා ලෙස සැලකෙන මූර්තියක් ඇන්ජිලෝ විසින් ද කර ඇති නිසා වර්තමානයේ දක්නට ලැබෙන පියෙටා මූර්තිය ඇන්ජිලෝගේ ම නිර්මාණය ලෙස බහුතරයක් දෙනා සලකති.

මූර්ති නිර්මාණයෙන් තරමක් මෑත් වී සිත්තම් කරණයට පිවිසි ඇන්ජිලෝ කිතු සමයට අදාළ සිද්ධි කිහිපයක්ම සිත්තමට නැගුවේය. ශාන්ත පීතර දෙව්මැදුරට ගෝලාකාර ශිඛර මාදිලියේ වහලය සැළසුම් කර දී ගෘහ සැලසුම් ශිල්පයට ද පිළිපන්නා පමණක් නොව ගෝලාකාර පිඩර මාදිලියි කරලියට ගෙන ඒමේ ගෞරවය ද හිමි කර ගත්තේය.

1564 පෙබරවාරි 12 වැනිදා දිනය ඔහුගේ දිවියේ තීරණාත්මක දිනයක් විය. එදින ඔහු වෙහෙස නොබලා කරුණාව (පියෙටා) නමැති අග්‍රමූර්තියේ කටයුතු කරමින් සිටියේය.

දෙදිනක් ගත වනවිට තදබල ලෙස උණ රෝගයෙන් පෙළුණු හෙතෙම බලවත් ලෙස දුර්වල භාවයට පැමිණියේය. ලෝකයේ කිසිදු කලාකරුවකුට කිසිදිනෙක ළඟා විය නොහැකි තරම් අග්‍රස්ථානයකට සම්ප්‍රාප්ත වී ලෝකයේ කිසිවෙකුට හෝ නිමකළ නොහැකි අන්දමේ අග්‍ර කලා කෘති ගණනාවක් ලොවට දයාද කළ මේ ශ්‍රේෂ්ඨ කලාකරුවානන් 1564 පෙබරවාරි 18 දින සිය අවසන් සුසුම්පොද මේ අනන්ත විශ්වයට මුදා හැරියේය.